# ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධාන යටතේ ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශක සභාව විසින් සම්පාදිතයි.**

නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය
හා
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාවට නංවනු ලැබේ.

## ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය හා එය ක්‍රියාත්මක කිරීම

පටුන


**1.0** හැදින්වීම

**2.0** සංදර්භය සහ පසුබිම සමාලෝචනය

- **2.1** ප්‍රතිපත්ති මූලාරම්භ
- **2.2** මෙහෙයුම් මූලධර්ම
- **2.3** ප්‍රතිපත්ති සංදර්භය
- **2.4** නෛතික සංදර්භය
- **2.5** සංවර්ධන සංදර්භය
- **2.6** ආර්ථිකය තුළ භූමිකාව
- **2.7** ප්‍රධාන පාර්ශවකරුවෝ

**3.0** ප්‍රතිපත්ති මූලිකාංග

- **3.1** දැක්ම ප්‍රකාශනය
- **3.2** ප්‍රතිපත්ති අරමුණු
- **3.3** ප්‍රතිපත්ති ඉලක්ක

**4.0** ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීම

- **4.1** රාජ්‍ය අංශයේ වගකීම් හා ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රන
- **4.2** කර්මාන්තයේ වගකීම් හා ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රන

**5.0** අනෙකුත් ආශ්‍රිත රජයේ ප්‍රතිපත්ති

**6.0** සමාප්තිය

## 1.0 හැඳින්වීම

1.1. ඉදිකිරීම් කර්මාන්තය ජාතික ආර්ථිකයට ප්‍රමුඛ දායකයත්වයක් සපයන්නතු හා ප්‍රධාන රැකියා උත්පාදයකු වේ. ඉදිකිරීම් කර්මාන්තයේ ඉදිරි සහ පසු සම්බන්ධක නිසාවෙන් එම කර්මාන්තය සංවර්ධනය කිරීම ජාතික සංවර්ධන ක්‍රියාදාමයෙහි ගුණක ප්‍රතිඵලයක් නිර්මාණය කරන අතර එය තිරසාර ජාතික ආර්ථික වර්ධනයකට හේතු කාරක වනු ඇත.

එබැවින්, සාකල්‍යය ප්‍රවේශයක් මත පදනම්ව, ඉදිකිරීම් කර්මාන්තයේ තිරසාර වර්ධනය අපේක්ෂා කරන්නා වූ ඉදිකරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව පවතී.

1.2. 2014 දෙසැම්බර් 29 වැනි දින පනවන ලද 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත, ඉදිකිරීම් කර්මාන්තය ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම පිළිබඳව උපදෙස් දීම පිණිස ඉදිකිරීම් පිළිබඳ ජාතික උපදේශක සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සලස්වා ඇත. ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධ කාරණා සහ එහි අරමුණුවලින් සමන්විත ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට පනත යටතේ මෙම සභාවට බලතල පවරා ඇත.

1.3. ප්‍රතිපත්තියේ අරමුණ වනුයේ නියාමනය, ප්‍රමිතිකරණය, ධාරිතා වර්ධනය හා පහසුකම් සැපයීම මගින් ජාතික සංවර්ධන අවශ්‍යතා සපුරාලන්නාවූ කාර්යක්ෂම ඉදිකිරීම් කර්මාන්තයක් ශ්‍රී ලංකාවේ නිර්මාණය කිරීමයි.

1.4. රාජ්‍ය අංශය හා පුද්ගලික අංශය සම්බන්ධ වී ඇති, ඉදිකිරීම් කර්මාන්තයට පොදුවේ මෙම ප්‍රතිපත්තිය අදාළ වනු ඇත. කර්මාන්තයේ විවිධ අංශවල සහ රේඛීය අමාත්‍යාංශවල ප්‍රධාන කාර්ය භාර සහ වගකීම් හඳුනාගනු ලැබ ඇත. අනුපූරකත්වය සහතික කිරීම පිණිස, ඒවායේ මෙහෙයුම් පසුබිම සහ ඒවාට අදාළ ප්‍රතිපත්ති සමග සුසංගත කරනු ලැබේ.

1.5. ජාතික ආර්ථිකයේ එහි භූමිකාව හා ආර්ථිකයේ විවිධ උප කොටස්වල වූ එහි බලපෑම් පැතුරුම, එහි මෙහෙයුම්වලට සම්බන්ධ විවිධ ක්‍රියාදාම සහ එහි ක්‍රියාකාරකම්වලට සහභාගිවන බොහෝ පාර්ශවකරුවන් සැලකිල්ලට ගැනීමේදී, ජාතික ඉදිකිරීම් කර්මාන්තය නියෝජනය කිරීම පිණිස සංකීර්ණ අන්තර්ක්‍රියාකාරී න්‍යාසයක් මතු වෙයි. කවර හෝ ජාතික ප්‍රතිපත්තියක් මෙම සංකීර්ණ වින්‍යාසයට බලපාන්නාවූ සියලු කරුණු සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.

1.6. ඉදිකිරීම් පිළිබඳ ජාතික උපදේශක සභාවේ නිර්දේශය සහිතව, ඉදිකිරීම් විෂය භාර අමාත්‍යවරයා විසින් ඉදිරිපත්කරනු ලබන මෙම ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු බලාත්මක වේ.

1.7. ඉදිකිරීම් සම්බන්ධ මෙම ජාතික ප්‍රතිපත්තිය, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධණ පනතේ 2(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව සම්පාදනය කර ඇත.

## 2.0 සංදර්භය හා පසුබිම සමාලෝචනය

### 2.1 මෙම ප්‍රතිපත්ති මූලාරම්භයට පහත දැක්වෙන කරුණු අන්තර්ගත වේ.

i. මානව සම්පත් සංවර්ධනය සඳහා සහාය
ii. රැකියා උත්පාදනය, දිළිඳුකම තුරන්කිරීම සහ සමාජ අභිවෘද්ධිය සඳහා ඉදිකිරීම් අංශය ඉලක්ක කිරීම.
iii. දේශීය ද්‍රව්‍ය සහ ආශ්‍රිත කර්මාන්ත වර්ධනය හරහා සහ ලිහිල් කළ වෙළඳාම හරහා ද්‍රව්‍ය, පිරියත හා උපකරණ පවතින බව සහතික කිරීම.
iv. බලාත්මක නියාමන රාමුවක් නිර්මාණය කිරීම
v. පැහැදිළි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා රෙගුලාසි ස්ථාපනය කිරීම හරහා රජයේ කොන්ත්‍රාත් සඳහා සාධාරණ තරඟයක් ඇති කිරීම.
vi. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් පාර්ශවකරුවන් සඳහා ජාතික ලේඛන (රෙජිස්තර) ස්ථාපිත කිරීම
vii. පුද්ගලික ප්‍රාග්ධනය සහ සෘජු විදේශ ආයෝජන ඇතුළුව යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආකර්ෂණීය ආයෝජන වටපිටාවක් නිර්මාණය කිරීම.

### 2.2 ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධ ප්‍රතිපත්තිය ව්‍යුහගත කිරීම සඳහා භාවිතා කරනු ලබන මෙහෙයුම් මූලධර්ම වනුයේ:

i. උපාය මාර්ගික ජාතික සංවර්ධන අරමුණු සඳහා පහසුකම් සැපයීම
ii. රාජ්‍ය සහ පුද්ගලික අංශ හවුල්කාරිත්ව සඳහා පහසුකම් සැපයීම හා අභිවර්ධනය
iii. යෝග්‍ය ආයතනික සැකසුම් හරහා ප්‍රමාණවත් සම්බන්ධීකරණය සහතික කිරීම
iv. කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ සඵල අධීක්ෂණයක් හා ඇගයීමක් ඇතිකිරීමට කටයුතු කිරීම.
v. ස්ථාපිත කරනු ලැබූ මාර්ගෝපදේශ, භාවිත සංග්‍රහ සහ ප්‍රමිති හා අනුකූලතාවය සහ පිළිපැදීම සහතික කිරීම.
vi. නිශේධනීය පාරිසරික බලපෑම් අවම කිරීම හා තිරසාර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම
vii. ප්‍රසම්පාදන ක්‍රියාදාමයේ තරඟකාරිත්වය හා පාරදෘශ්‍යතාවය ඉහළ නැංවීම
viii. පුද්ගලික අංශයේ ආයෝජන හා ව්‍යවසායකත්වය සඳහා පහසුකම් සපයන සමාජීය හා ආර්ථික පරිසරයක් නිර්මාණය කිරීම.
ix. ජාතික ඉදිකිරීම් කර්මාන්තයට අදාළව රජයේ කර්තව්‍ය හා ප්‍රමුඛතා ස්ථාපිත කිරීම.
x. කර්මාන්තයේ යෙදී සිටින පිරිස් ජාත්‍යන්තර සහතික කිරීමේ මට්ටමට උසස් කිරීම සඳහා පුහුණු ප්‍රමිති ප්‍රවර්ධනය කිරීම.
xi. ශ්‍රී ලංකාවේ ව්‍යාපෘතිවල නිරතව සිටින විදේශීය උපදේශකයන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් දේශීය ඉදිකිරීම් කර්මාන්තයට තාක්ෂණය පැවරුම ප්‍රවර්ධනය කිරීම.
xii. ඉදිකිරීම් කර්මාන්තය ආශ්‍රිත සේවා අපනයනය ප්‍රවර්ධනය කිරීම.

### 2.3 ප්‍රතිපත්ති සංදර්භය

රාජ්‍ය අංශය හා පුද්ගලික අංශය සම්බන්ධ වී ඇති, ඉදිකිරීම් කර්මාන්තයට පොදුවේ මෙම ප්‍රතිපත්තිය අදාළ වනු ඇත. මෙහෙයුම් පසුබිමේ සිටින අමාත්‍යාංශවල ප්‍රධාන කාර්ය භාර සහ වගකීම් පහත දැක්වෙන පරිදි පෙන්නුම් කෙරේ. ඒ ඒ මෙහෙයුම්වල සමයෝගිතාව සහතික කිරීම පිණිස, මෙම ප්‍රතිපත්තිය මගින් අදාළ ක්‍රියාකාරකම් එකී අමාත්‍යාංශ සමග සුසංගත කරනු ඇත.

රාජ්‍ය අංශය- ජාතිකඉදිකිරීම් ප්‍රතිපත්තියට සහ ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයට අදාළව අමාත්‍යාංශවල ප්‍රධාන කාර්යභාර සහ වගකීම් පහත දැක්වෙන පරිදිය.

i. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, මාර්ගෝපදේශ සකස් කිරීම සහ අරමුණු සපුරාගැනීම අධීක්ෂණය සඳහා යාන්ත්‍රන ස්ථාපිත කිරීම පිණිස ඉදිකිරීම් විෂය සඳහා වගකිවයුතු අමාත්‍යාංශය අනෙකුත් අදාළ අමාත්‍යාංශ සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ඇත.

ii. ප්‍රසම්පාදනය හා අනෙකුත් ආශ්‍රිත මූල්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රතිපත්ති සඳහා මුදල් අමාත්‍යාංශය වගකිව යුතුවේ.

iii. ඉඩම්, භෞතික සැලසුම්කරණය සහ පරිසර විෂයය සඳහා වගකිවයුතු අමාත්‍යාංශ, භෞතික සැලසුම්කරණ හා පාරිසරික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වගකිව යුතු වේ.

iv. කම්කරු නීති සහ ආශ්‍රිත ප්‍රතිපත්ති සම්බන්‍ධයෙන් කම්කරු විෂය සඳහා වගකිව යුතු අමාත්‍යාංශය වගකිව යුතු වේ.

v. මානව සම්පත් සංවර්ධනය ආශ්‍රිත ප්‍රතිපත්ති සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන, නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු විෂය භාර අමාත්‍යාංශ වගකිව යුතු වේ.

vi. නාගරික සංවර්ධන, නිවාස, ජල සම්පාදන සහ ජලාපවාහන විෂය සඳහා වගකිව යුතු අමාත්‍යාංශ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති හා ප්‍රමිති සඳහා වගකිව යුතු වේ.

vii. විදුලිබල, බලශක්ති සහ විදුලි සංදේශ විෂය සඳහා වගකිව යුතු අමාත්‍යාංශ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති හා ප්‍රමිති සඳහා වගකිව යුතු වේ.

viii. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ ගුවන් තොටුපොළ විෂය සඳහා වගකිව යුතු අමාත්‍යාංශ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති හා ප්‍රමිති සඳහා වගකිව යුතු වේ.

ix. වෙරළ සංරක්ෂණ, වාරිමාර්ග, ඉඩම් හා ගංවතුර පාලන විෂය සඳහා වගකිව යුතු අමාත්‍යාංශ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති හා ප්‍රමිති සඳහා වගකිව යුතු වේ.

**x. ආපදා කළමනාකරණ විෂය සඳහා වගකිව යුතු අමාත්‍යාංශ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති හා ප්‍රමිති සඳහා වගකිව යුතුවේ.**

## 2.4 නෛතික සංදර්භය

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශක සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සපයයි. ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය හා එය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය එකී සභාව විසින් සකස් කළ යුතු බව පනතේ දැක්වේ.

ඉදිකිරීම් සම්බන්ධ එම ජාතික ප්‍රතිපත්තිය, එකී පනතේ විධිවිධාන යටතේම පිහිටුවනු ලබන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ප්‍රවර්ධනය කොට ක්‍රියාවට නැංවිය යුතුය.

## 2.5 සංවර්ධන සන්දර්භය

ඉදිකිරීම් කර්මාන්තය සෘජුවම ආර්ථිකයේ බොහෝ උප අංශවල අවශ්‍යතා සපුරාලයි. ඉදිකිරීම් කර්මාන්තය කාර්යක්ෂම, පිරිවැය ඵලදායී වන විට සහ නියමිත වේලාවට කාර්යය ඉටුකරන විට මෙම උප අංශ මගින් ආර්ථිකයට දක්වන දායකත්වය පැහැදිළිව දැනෙනු ඇත. ව්‍යාපෘති සම්පාදනයේ සිට නිමාකළ ගොඩනැගිලිවල මෙහෙයුම් හා නඩත්තුව දක්වා ඉදිකිරීම් කර්මාන්තයේ මෙහෙයුම් ක්‍රියාදාම මාලාවක් තිබේ. තාක්ෂණවේදය අනුව ගත් කළ දේශීය දැනුම් පද්ධති මෙන්ම අති නවීන ක්‍රමවේද සඳහා එය අවස්ථාව ලබා දිය යුතුය. පුද්ගලයන් විසින් ඉටුකිරීමට බාරගනු ලබන ක්‍රියාකාරකම් සහ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ මහා පරිමාණ සංවිධාන විසින් කොන්ත්‍රාත් මත ක්‍රියාවට නංවන ව්‍යාපෘති ද ඊට ඇතුළත් වේ.

## 2.6 ආර්ථිකය තුල භූමිකාව

දළ දේශීය නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයකට දායක වෙමින් සහ කර්මාන්ත අංශයේ ප්‍රධාන රැකියා අවස්ථා උත්පාදනය කරමින් ඉදිකිරීම් කර්මාන්තය ජාතික ආර්ථිකයේ තීරණාත්මක කාර්ය භාරයක් ඉටුකරයි.

ඉදිකිරීම් කර්මාන්තය විසින් ජාතික සංවර්ධණ ක්‍රියාවලිය බොහෝ අංශවලින් උත්තේජනය කරයි. ජාතික ආර්ථිකයේ තිරසාර වර්ධනය සඳහා මංපෙත් විවෘත කරන ඉදිරි හා පසු සම්බන්ධක මේ සඳහා හේතු කාරක වේ.

## 2.7 ප්‍රධාන පාර්ශවකරුවෝ

ඉදිකිරීම් කර්මාන්තයේ හවුල්කරුවෝ පාර්ශවකරුවන් ගණනාවකින් සමන්විත වේ. පළමුව, වැඩ උත්පාදනය කරන්නා වූ ආයෝජකයා හෝ සංවර්ධකයා සිටී. මෙම වැඩ සම්පාදනය කොට සැලසුම් කරනු ලබන්නේ සැලසුම්කරුවන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, ඉංජිනේරුවන්, ප්‍රමාණ සමීක්ෂකයන්, ව්‍යාපෘති කළමනාකරුවන් සහ මූල්‍ය උපදේශකයන් ආදී විශේෂඥ වෘත්තිකයන් කණ්ඩායම් විසිනි.

කොන්ත්‍රාත්කරුවන්, ඉදිකිරීම් ද්‍රව්‍ය නිපදවන්නන් සහ සැපයුම්කරුවන් සහ ඉදිකිරීම් උපකරණ සැපයුම්කරුවන් හා කුලියට ලබාදෙන්නන් සහ ඉදිකිරීම් ශිල්පීන් භෞතික පහසුකම් සඳහා දායක වේ.

ප්‍රතිපත්ති සම්පාදකයන්, ප්‍රමිති නියාමකයන්, අධ්‍යාපන, පරික්ෂා කිරීම් සහ පුහුණු සංවිධාන, වෘත්තීයවේදී සංවිධාන සහ පර්යේෂණ ආයතන ආදියද තමන්ගේ අදාළ භූමිකා ඉටුකරයි.

ඒ අනුව, ඉදිකිරීම් කර්මාන්තය නියෝජනය කිරීම සඳහා සංකීර්ණ අන්තර්ක්‍රියාකාරී න්‍යාසයක් බිහිවේ. ඕනෑම ජාතික ප්‍රතිපත්තියක් මෙම සංකීර්ණ න්‍යාසය කෙරෙහි බලපාන සියලු ගැටලු සඳහා පිළියම් යෙදිය යුතු වේ.

# 3.0 ප්‍රතිපත්ති මූලිකාංග

## 3.1 දැක්ම ප්‍රකාශනය

ගෝලීය සම්මත ප්‍රමිතින් හා අනුකූලවූ නියාමනය හා ප්‍රමිතිකරණය තුළින් ආර්ථික සංවර්ධන අවශ්‍යතා ඉටු කිරීමෙන්, ශ්‍රී ලංකාවේ කාර්යක්ෂම ඉදිකිරීම් කර්මාන්තයක් සාක්ෂාත් කර ගැනිම.

### 3.2 ප්‍රතිපත්ති අරමුණු

ඉදිකිරීම් කර්මාන්තයේ සියලු පාර්ශවකරුවන්ට ක්‍රමෝපායික නායකත්වය සැපයීම, තිරසාර වර්ධනය ප්‍රතිසංස්කරණ සහ වැඩිදියුණු කිරීම් උත්තේජනය කිරීම, අඩු පිරිවැය සහ පරිසර හිතකාමී තාක්ෂණය, ගොඩනැගිලි ද්‍රව්‍ය හා පද්ධති ප්‍රවර්ධනය කිරීම, යෝග්‍ය පර්යේෂණ ප්‍රවර්ධනය සහ පර්යේෂණ කටයුතු ප්‍රචාරණය හා ප්‍රකාශයට පත්කිරීම, ප්‍රමිති සහ චර්යා ධර්ම සහ භාවිත සංග්‍රහ සම්පාදනය කිරීම සහ ඉදිකිරීම් සේවා අපනයනය ප්‍රවර්ධනය කිරීම මෙම ප්‍රතිපත්ති අරමුණුවලට අයත් වේ.

### 3.3 ප්‍රතිපත්ති ඉලක්ක

ප්‍රතිපත්ති ඉලක්ක පහත කරුණු ඉලක්ක කළ යුතුය. ඉදිකිරීම් කර්මාන්තයේ ක්‍රියාකාරකම් නියාමනය හා ප්‍රමිතිකරණය, පාර්ශවකරුවන් ලියාපදිංචිය, කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපාර සහ සේවකයන්ගේ අභිවෘද්ධිය සහ යහපැවැත්ම සඳහා ක්‍රියාමාර්ග, ආරවුල් බේරුම්කරණය වඩා ලාබදායී හා වේගවත් කිරීම සහ ඉදිකිරීම් කාර්යයන්හිදී මහජන ආරක්ෂාව සහ සෞඛ්‍යය සහතික කිරීම.

## 4.0 ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය

### 4.1 රාජ්‍ය අංශයේ වගකීම් සහ ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රන

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 1- ඉදිකිරීම් අංශයේ තිරසාර සංවර්ධනය, ප්‍රතිසංස්කරණ සහ උන්නතිය උත්තේජනය පිණිස ඉදිකිරීම් කර්මාන්තයේ පාර්ශවකරුවන්ට ක්‍රමෝපායික නායකත්වය ලබාදීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රන ය**

*ප්‍රතිපත්ති මට්ටමේදී සමායෝජිත ප්‍රවේශයක් සහතික කිරීම පිණිස ඉදිකිරීම් පිළිබඳ ජාතික උපදේශක සභාව සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ප්‍රධාන පෙළේ කැබිනට් අමාත්‍යවරු සහ ඉදිකිරීම්, යටිතල පහසුකම් සැපයුමේ සහ මූල්‍යායනයේ නියුක්ත රාජ්‍ය හා පුද්ගලික අංශයේ අනෙකුත් සංවිධාන සමග කටයුතු කරනු ඇත.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 2- කලින් කලට නිර්දේශ කිරීමට ඉඩ ඇති පරිදි, ඉදිකිරීම් කර්මාන්තයේ සියලු පාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරකම් නියාමනය සහ අධීක්ෂණය කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය**

*ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය රාජ්‍ය අංශයේ අදාළ නියෝජිතායතන හා වෘත්තීයවේදීන්ගේ සංවිධාන විමසා:-*

I. *මාර්ගෝපදේශ සමාලෝචනය කර හා යාවත්කාලීන කර සියලු පාර්ශවකරුවන් සඳහා ලියාපදිංචි කිරීමේ හා අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාවට නංවනු ඇත.*

II. *රාජ්‍ය සහ පුද්ගලික අංශ අතර, සම්මත ලංසු ලේඛන සහ එවැනි අනෙකුත් මාර්ගෝපදේශ හා ප්‍රකාශන ඒකාකාර අන්දමින් අදාළ කිරීම සහතික කරනු ඇත.*

III. *ආරවුල් නිරාකරණය කිරීමේ විකල්ප ක්‍රමවේද සහ අවශ්‍ය නීති ස්ථාපිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම මගින් ඉදිකිරීම් ආශ්‍රිත ආරවුල් සඵලව සහ කඩිනමින් නිරාකරණය සහතික කරනු ඇත.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 3 - ආපදා ප්‍රත්‍යාස්ථිතික, අඩු පිරිවැය සහ පාරිසරිකව තිරසාර ගොඩනැගිලි, ව්‍යුහ සහ ඉදිකිරීම් පරිචයන් සැලසුම් කිරීම හා වර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් ඉදිකිරීම් කර්මාන්තයේ තිරසාර ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය**

*ආපදා ප්‍රත්‍යාස්ථිතික අඩු පිරිවැය සහ පාරිසරිකව තිරසාර ඉදිකිරීම් පරිචයන් සම්පාදනය කිරීම සඳහා අදාළ වෘත්තීයවේදීන්ගේ ආයතන, පර්යේෂණ සංවිධාන සහ විශ්වවිද්‍යාල විමසා උපමාන හා මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම පිණිස ඉදිකිරීම්, ආපදා කළමනාකරණ, විදුලිබල හා බලශක්ති සහ පරිසරය විෂය සඳහා වගකිව යුතු අමාත්‍යාංශ එකිනෙක සමග සහයෝගිතාවයෙන් කටයුතු කරනු ඇත.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 4- ඉදිකිරීම් කර්මාන්තය සහ එහි සංවර්ධනය ආශ්‍රිත කරුණු පිළිබඳ නව්‍යකරණ, පර්යේෂණ, පර්යේෂණ කාර්යය පිළිබඳ තොරතුරු ප්‍රචාරණය හා ප්‍රකාශනය ප්‍රවර්ධනය කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය**

*කර්මාන්තයේ සුවිශාල ආයතන, විශ්වවිද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන, ජාත්‍යන්තර සංවිධාන, රජයේ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන අතර සහයෝගීතාව හරහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ද්‍රව්‍ය, ගොඩනැගිලි, සහ ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳව සහ " භූ තාක්ෂණික විමර්ශන සහ සැලසුම්"ක්ෂේත්‍රය පිළිබඳව සුවිශේෂිව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් ද පර්යේෂණ සහ සංවර්ධනය කිරීම දිරිගන්වනු ඇත.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 5- ඉදිකිරීම් කර්මාන්තය සඳහා ජාතික ප්‍රමිති සහ පිරිවිතර ස්ථාපිත කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය:**

*ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හා අනෙකුත් අදාළ බලධාරීන් විමසා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ඉදිකිරීම් කර්මාන්තයට අදාළ වන ප්‍රමිති සහ ජාතික ගුණත්ව පිරිවිතර, ඉදිකිරීම් ද්‍රව්‍යයන්හි නිෂ්පාදන අනුකූලතා ප්‍රමිතීන්ද ඇතුලත්ව සම්පාදනය කර එම ප්‍රමිති සහ පිරිවිතර අනිවාර්ය සහ ස්වේච්ඡා ලෙස වර්ගීකරණය කරනු ඇත.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 6- ඉදිකිරීම් කර්මාන්තයට අදාළ යහපත් පරිචයන් ප්‍රවර්ධනය සඳහා චර්යා ධර්ම සංග්‍රහ, පරිචයන්, පරිපාටි, ක්‍රියාදාම සහ ලේඛන ගත කිරීම් ස්ථාපනය කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය:**

*ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙළඳ සංසද ඇතුළුව සියලු පාර්ශවකරුවන් සහ වෘත්තීයවේදීන්ගේ ආයතන විමසා යෝග්‍ය චර්යා ධර්ම සංග්‍රහ සහ පිළිගත හැකි පරිචයන් සකස් කරනු ඇත. වගකීම් පැහැර හැරීමට එරෙහිව අදාළ අවස්ථාවන්හිදී යෝග්‍ය සම්බාධක ක්‍රියාදාමය තුලට ඇතුලු කරනු ඇත.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 7 - ඉදිකිරීම් කර්මාන්තයේ මානව සම්පත්වල මානව ප්‍රාග්ධනය, වෘත්තීයභාවය, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය :**

*ඉදිකිරීම් අමාත්‍යාංශය අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු සඳහා වගකිව යුතු අමාත්‍යාංශ සමග සහයෝගීතාවයෙන් යුතුව සහ වෘත්තීයවේදීන්ගේ අදහස් විමසා:*

I. කර්මාන්තයේ මිනිස්බල හිඟයට පිළියම් යෙදීම සඳහා වැඩසටහන් සකස් කරනු ඇත.
II. වෘත්තීයවේදීන්ගේ, තාක්ෂණික නිලධාරීන්ගේ සහ ශිල්පීන්ගේ කාර්යසාධනයේ ගුණාත්මකභාවය ඉහළ නංවනු ඇත.
III. කර්මාන්තයේ තොරතුරු තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය කරනු ඇත.
IV. කර්මාන්තයේ පිරිස් සඳහා නිසි පිළිගැනුමක් ලබාදීම සහ ඔවුන්ගේ ප්‍රතිරූප ගොඩනැංවීම සහ
V. චර්යා ධර්ම සංග්‍රහ හරහා යහපත් පරිචයන් සහ ප්‍රමිති දිරි ගැන්වීම.

*මානව සම්පත් සංවර්ධන මූලාරම්භයන් පහත අරමුණු සහිතව ක්‍රියාත්මක කරනු ඇත.*

*අ. කර්මාන්තයේ රැකියා සඳහා කාන්තාවන්ට අවස්ථාව ලබාදීම.*
*ආ. 'විශේෂ අවශ්‍යතා' කණ්ඩායම් සඳහා අවස්ථා සැපයීම*
*ඇ. සේවකයන් සඳහා නිසි පාරිශ්‍රමික සහතික කිරීම*
*ඈ. කර්මාන්තයේ පිරිස් සඳහා නිසි පිළිගැනුම සහ ප්‍රතිරූප ගොඩනැගීම*
*ඉ. පුහුණු ශ්‍රමය සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම සහ කර්මාන්තයේ නුපුහුණු සේවා බලකාය ක්‍රමවත් ආකාරයකින් පුහුණු කිරීම සහ කම්කරු සහ උප කොන්ත්‍රාත් ක්‍රමවේදය නියාමනය කිරීම*
*ඊ. නිපුණ සහ පුහුණු සේවකයන් පිළිගැනීම සහ සහතිකකරණය සඳහා පහසුකම් සැපයීම*
*එ. ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ සේවා බලකායේ ජාතික වෘත්තීය සුදුසුකම් සහිත නිශ්චිත අවම ඉදිකිරීම් පුහුණු සේවක සංඛ්‍යාවක් සඳහා රැකියා සඳහා පහසුකම් සැපයීම.*
*ඒ. ඉදිකිරීම් සේවකයන් සඳහා අනතුරු රක්ෂණය සහ විශ්‍රාමික ප්‍රතිලාභ ප්‍රවර්ධනය කිරීම*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 8 - ඉදිකිරීම් කර්මාන්තයේ වෘත්තීය නිරුපද්‍රිතතාව සහ සෞඛ්‍ය ප්‍රමිති වැඩි දියුණු කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය**

*ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය:*

i. *ඉදිකිරීම් සේවක පිරිස් සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂිත ප්‍රමිති සහතික කරනු ඇත.*
ii. *සියලු ඉදිකිරීම් ව්‍යාපෘතිවල වැඩබිම් නිශ්චිත ආරක්ෂක කළමනාකරණ සැලසුම් හෝ නිරුපද්‍රිත වැඩ ක්‍රමවේද සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පරිපාටි සඳහා පහසුකම් සපයනු ඇත.*
iii. *සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ක්ෂෙත්‍රයන්හි සේවක පිරිස් පුහුණුව දිරිමත් කිරීම මගින් ඉදිකිරීම් කටයුතු නිරුපද්‍රිත සහ සෞඛ්‍යයට හානිකර නොවන බවට පත් කෙරෙන ක්‍රියාදාම අර්ථ නිරූපණය කරනු ඇත.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 9 - ඉදිකිරීම් කර්මාන්ත ක්‍රියාදාමයන්හි කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණය යොදාගැනීම වැඩි කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය**

අදාළ නියෝජිතායතන සමග එකතුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පහත කරුණු හඳුනාගෙන ප්‍රවර්ධනය කරනු ඇත.

i. *ඉදිකිරීම් කර්මාන්තයේ සැලසුම්කරණය සහ නිර්මාණකරණය, ඇස්තමේන්තු කිරීම සහ පිරිවැය පාලනය කිරීම, ප්‍රලේඛනය සහ සන්නිවේදනය, ව්‍යාපෘති කළමනාකරණය සහ කොන්ත්‍රාත් පරිපාලනය ආදියේදී යෝග්‍ය තොරතුරු තාක්ෂණය පාදක පද්ධති භාවිතය*

ii. *ඉදිකිරීම් කර්මාන්තයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය වැඩියෙන් භාවිතා කිරීම.*

iii. *සම්පත්, ව්‍යාපෘති, කර්මාන්තයේ හවුල්කරුවන් සහ කර්මාන්ත අංශය ආශ්‍රිත සම්බන්ධක පිළිබඳ තොරතුරු සමගින් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී කර්මාන්ත ව්‍යාප්ත සංඛ්‍යාලේඛන දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 10 - ඉදිකිරීම් කර්මාන්ත සහ සේවක පිරිස සඳහා විදේශීය වෙළඳපොළ වෙත ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය**

*විදේශ කටයුතු සහ වාණිජ කටයුතු සඳහා වගකිව යුතු අමාත්‍යාංශ, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා මහ බැංකුව සමග සහයෝගීතාවයෙන් යුතුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය ඉදිකිරීම් අමාත්‍යාංශය හරහා:*

i. *ඉලක්ක රටවල රැකියා අවස්ථා පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම පිණිස ජාලයක් ස්ථාපිත කරනු ඇත.*
ii. *දේශීය කර්මාන්තය සඳහා එවැනි රැකියා ලබාගැනීම සඳහා ඵලදායි පරිසරයක් නිර්මාණය කිරීම*
iii. *දේශීය කර්මාන්තය සඳහා විදේශ රැකියා ලබාගැනීම සඳහා ප්‍රවර්ධන ප්‍රයත්න සඳහා පහසුකම් සැපයීම*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 11 - ඉදිකිරීම් කර්මාන්තයේ දේශීය හා විදේශීය ආයෝජන සඳහා බලාත්මක පරිසරයක් නිර්මාණය කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය**

*ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය අනෙකුත් නියාමන බලධාරීන් සහ අනුමත කිරීමේ නියෝජිතායතන සමග එකතුව:*

i. *ඉදිකිරීම් කර්මාන්තයේ ආයෝජන සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා අනුමත කිරීමේ ක්‍රියාදාම වැඩි දියුණු කිරීමට හා කඩිනම් කිරීමට හේතු කාරක වන ප්‍රතිසංස්කරණ ස්ථාපිත කිරීම*

ii. *අවශ්‍ය හැකියා සහිත නව ව්‍යවසාය සහ සේවා සපයන්නන් වර්ධනය සහ සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම*

iii. *පුද්ගලික අංශයෙන් සහ සෘජු විදේශ ආයෝජනවලින් ඉදිකිරීම් සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට යාන්ත්‍රන ස්ථාපිත කිරීම.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 12 - ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය සමග ආපදා ප්‍රත්‍යස්ථිතික ඉදිකිරීම් ප්‍රමිතීන් හා පරිචයන් ඇතුළුව, කර්මාන්ත පරිචයන්ගේ අනුකූලතාව සහතික කිරීම පිණිස අධීක්ෂණ හා ඇගයීම් පරිපාටියක් ස්ථාපිත කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය**

*ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධණ අධිකාරිය:*

i. *ඉදිකිරීම සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සමග ඉදිකිරීම් ක්‍රියාකාරකම් අනුකූල වන බවට සහතික කිරීම සඳහා එම ක්‍රියාකාරකම් පිළිබඳ අධීක්ෂණ, ඇගයීම් සහ වාර්තාකරණ පද්ධතියක් ස්ථාපිත කරනු ඇත.*

ii. *ජයග්‍රහණ සහ නව ව්‍යවසාය වර්ධණ පිළිබඳ දත්ත ග්‍රහණය කරනු ඇත.*

iii. *ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ගෙවීමට නියමිත කොන්ත්‍රාත් ගෙවීම් නිසි වේලාවට පියවීම සහතික කරනු ඇත.*

iv. *ආපදා ප්‍රත්‍යස්ථිතික ඉදිකිරීම් පරිචයන් සහ ව්‍යුහයන් සමඟ අනුගතවීම සඳහා සහ රෙගුලාසි හා උපද්‍රවවලට තුඩුදෙන ප්‍රදේශයන්හි ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් නිකුත් කරන ආපදා අවදානම් ඇගයීම් වාර්තා ලබා ගැනිම සමඟ අනුගතවීම සහතික කිරීම සඳහා, අධික්ෂණ, ඇගයීම් සහ වාර්තාකරණ පද්ධතියක් ස්ථාපිත කරනු ඇත.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 13 - විදේශීය කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශකයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ අරමුදල් සපයන ඉදිකිරීම් ව්‍යාපෘතිවල දේශීය සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය:**

*ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා විදේශීය මූලාශ්‍ර මගින් අරමුදල් සපයනු ලබන විටදී සහ විදේශීය උපදේශකයන් සහ විදේශීය කොන්ත්‍රාත්කරුවන් විසින් ක්‍රියාවට නැංවීම අවශ්‍ය කරනු ලබන විටදී, දේශීය ඉදිකිරීම් කර්මාන්තයේ තාක්ෂණ පැවැරුම සහ ධාරිතා ගොඩනැගීම සහතික කරනු පිණිස එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී හවුල්කාරිත්ව, ඒකාබද්ධ ව්‍යාපාර සහ උප කොන්ත්‍රාත්කරණය හරහා දේශීය සංවිධානවල සහභාගිත්වය දිරි ගන්වනු ලැබේ.*

*ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය:*

i. *අරමුදල් සඳහා වන සියලු සාකච්ඡාවලට මෙම ප්‍රතිපත්තිය අන්තර්ගත කරනු ලැබීමට හැකිවනු පිණිස මුදල්, ක්‍රම සම්පාදන සහ විදේශ කටයුතු අමාත්‍යාංශ සමග සම්බන්ධීකරණය පවත්වා ගනු ඇත.*

ii. *ආධාර ප්‍රදායකයන්ගේ අරමුදලින් ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා වත්මනෙහි ලබාදෙන දේශිය වරණය අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කරනු ඇත.*

## 4.2 කර්මාන්තයේ වගකීම් සහ ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රන

ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තියේ රජයේ වගකීම් අනුපූරණය කරමින් සංසක්තබව, කළමනාකරණය සහ කාර්ය සාධනයේදී කර්මාන්තය ශක්තිමක් කිරීම ආශ්‍රිතව එහි තීරණාත්මක ක්ෂේත්‍ර ගණනාවක තමන්ට ද වගකීමක් තිබෙන බව පුද්ගලික අංශය අවබෝධ කරගත යුතුය.

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 14 - ප්‍රතිපත්ති සංවර්ධනයේදී පුද්ගලික අංශයේ සහභාගිත්වය දිරිමත් කරන්න**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය:**

i. *ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ අදහස් විමසීම සඳහා රජය විසින් ස්ථාපිත කරනු ලැබූ යාන්ත්‍රනයන්ට නිර්දේශ ලබාදීම මගින් සක්‍රියව සහභාගිවීමට සහ දායකවීමට පුද්ගලික අංශය දිරිගන්වනු ලැබේ.*

ii. *කර්මාන්තයට බලපාන හෝ එහි අනුකූලතාවය සහතික කරන ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ නිර්දේශ ලබා ගැනීම සහ දැනට පවතින හෝ යෝජිත කවර හෝ නීතියකට සම්බන්ධ කරුණු පිළිබඳ උපදෙස් ලබාදීම පිණිස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, කර්මාන්තය සමග උපදේශන යාන්ත්‍රනයක් පිහිටුවනු ඇත.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 15 - කර්මාන්තය විසින් ඉදිකිරීම් ව්‍යාපෘති සඵලව කළමනාකරණය කිරීම දිරිමත් කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය:**

*ඉදිකිරීම් නිමැවුම්වල කාර්යක්ෂමතාව, ගුණාත්මකභාවය සහ නියමිත කාලයට සේවා සැපයීම සාක්ෂාත් කරගැනීම පිණිස යෝග්‍ය විශ්වීයව පිළිගත් ව්‍යාපෘති කළමනාකරණ පරිචයන් යොදා ගැනීමට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සියලු පාර්ශවකරුවන් උනන්දු කරවනු ඇත.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 16 - කර්මාන්තයේ හවුල්කරුවන් අතර චර්යා ධර්ම සංග්‍රහයක් ස්ථාපිත කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය:**

i. *තම තමන්ගේ වෘත්තීය සංවිධාන හරහා තම කණ්ඩායම් සඳහා චර්යා ධර්ම සංග්‍රහයක් සහ පිළිගත හැකි පරිචයන් සකස් කොට අනුගමනය කරන බවට වග බලා ගැනීම පිණිස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය කොන්ත්‍රාත්කරුවන්, උපදේශකයන්, ව්‍යාපෘති කළමනාකරුවන් සහ සංවර්ධකයන් සමග සම්බන්ධීකරණය පවත්වා ගනු ඇත.*

ii. *ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සමග සහයෝගිතාවයෙන් යුතුව අදාළ ශිල්පීන් අතර කර්මාන්තයට අදාළ කරුණු පිළිබඳව උපදේශනය සහ චර්යා ධර්ම ස්ථාපිත කිරීම සඳහා හැකියාව ඇතිකිරීම පිණිස ශිල්පීන්ගේ සංසද පිහිටුවීමට ශිල්පීන් දිරිමත් කෙරේ.*

iii. *ඒ අනුව, කර්මාන්තයට සම්බන්ධ පාර්ශවකරුවන් අතර කාර්ය සබඳතා සම්බන්ධයෙන් කර්මාන්තයේ ප්‍රමිති පැහැදිළි කරමින් කර්මාන්ත ව්‍යාප්ත චර්යා ධර්ම පද්ධතියක් ඔවුන් විසින් සකස් කරනු ඇත.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 17- ඉදිකිරීම් කර්මාන්තයේ මානව සම්පත් සංවර්ධනය දිරි ගැන්වීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය:**

i. *පුහුණු සේවකයන්ගේ සංචිතය පුළුල් කිරීම පිණිස රජය සමග යෝග්‍ය හවුල්කාරිත්ව සැකසුම් හරහා මානව සම්පත සංවර්ධනය කිරීමේ අරමුණට සහයෝගය ලබා දීමට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය දේශීය කර්මාන්තය දිරි ගන්වනු ඇත.*

ii. *ශිල්පිය මට්ටම සඳහා ආධුනිකත්ව පුහුණු බඳු ව්‍යුහගත පිවිසුම් මට්ටමේ පුහුණු පිරිනැමීමට කර්මාන්තය උනන්දු කරවීම.*

iii. *පුහුණු සහ අර්ධ පුහුණු අභ්‍යාසලාභී ශිල්පීන්ට ගෙවීමක් සහිතව හෝ රහිතව කාර්යස්ථ පුහුණු අවස්ථා ලබා දීමට කර්මාන්තය උනන්දු කරවීම.*

**ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය 18 - ඉදිකිරීම් කර්මාන්තයේ යෝග්‍ය ප්‍රසම්පාදන පරිචයන් ස්ථාපිත කිරීම**

**ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය:**

i. *රජයේ සහ පුද්ගලික කොන්ත්‍රාත් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සේවා සපයන්නන්ට හැකියාව ඇති කිරීම පිණිස සුදුසු ප්‍රතීතනය සහ ලියාපදිංචි වීම ලබා ගැනීමට ඔවුන් දිරිමත් කරනු ලැබේ.*

ii. *සාධාරණ තරඟකාරිත්වය සහ ප්‍රසම්පාදන පරිචයන් වැඩි දියුණු කිරීමට කර්මාන්තයේ පාර්ශවකරුවන් දිරිමත් කරනු ලැබේ.*

iii. *නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පැහැර හැරීම් සිදුකරන සමාගම් සඳහා ස්ථාපිත කරනු ලැබූ අධීක්ෂණ යාන්ත්‍රන සමග කර්මාන්තයේ පාර්ශවකරුවන් සහයෝගයෙන් කටයුතු කරනු ඇත.*

## 5.0 අනෙකුත් ආශ්‍රිත රජයේ ප්‍රතිපත්ති

ඉදිකිරීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය විසින් පහත දැක්වෙන සබැඳි ප්‍රතිපත්ති සමග සහක්‍රියා පිළිගැනීම සහ ස්ථාපිත කිරීම අවශ්‍ය වේ: අධ්‍යාපන ප්‍රතිපත්තිය, ජාතික නිවාස ප්‍රතිපත්තිය, මාර්ග සහ මහාමාර්ග අංශ ප්‍රතිපත්තිය, නාගරික සංවර්ධන ප්‍රතිපත්තිය, භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්ති, බලශක්ති අංශ ප්‍රතිපත්තිය, වාරිමාර්ග සහ ඉඩම් ජලාපවාහන ප්‍රතිපත්තිය, වෙරළ සංරක්ෂණ සහ පාරිසරික ප්‍රතිපත්ති, ජල සම්පාදන ප්‍රතිපත්තිය/දියබෙත්ම කළමනාකරණ ප්‍රතිපත්තිය, සනීපාරක්ෂක ප්‍රතිපත්තිය, වෘත්තීය පුහුණු ප්‍රතිපත්ති, ජාතික කම්කරු ප්‍රතිපත්ති, ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය, පළාත් පාලන ප්‍රතිපත්තිය, වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිය, ආයෝජන ප්‍රතිපත්තිය/ආර්ථික ප්‍රතිපත්තිය, සහ වත්මනෙහි ස්ථාපිත කර ඇති හෝ අනාගත දිනයක ස්ථාපිත කිරීමට නියමිත අනෙකුත් සියලු ආශ්‍රිත ප්‍රතිපත්ති.

## 6.0 සමාප්තිය

ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනයේ අරමුණු සපුරා ගැනීම සඳහා සාධාරණත්වය, පිරිවැය ඵලදායීතාව, සේවා කලට වේලාවට සැපයීම සහ ගුණාත්මකභාවය සංලක්ෂණය කරන්නා වූ කාර්යක්ෂම ඉදිකිරීම් කර්මාන්තයක් වත්මනෙහි තීරණාත්මක අවශ්‍යතාවයක් වේ. ජාතික ඉදිකිරීම් කර්මාන්තයට මග පෙන්වීම සහ එය සංවර්ධනය කිරීම පිණිස සංසක්ත හා විස්තීරණ ප්‍රතිපත්තියක් තිබීම රජයේ, කර්මාන්තයේ සහ මහ ජනතාවගේ යහපත සඳහා වනු ඇත. ඉදිකිරීම් සම්බන්ධ ඉහත ජාතික ප්‍රතිපත්තිය මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කොට ඇත.

ඍ